ඇගිලි අතර ගල්කැට තබා විඳීමෙන් අල්ලාහ්ගේ දූතයාණන් - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වළක්වා “සැබැවින්ම එය දඬයම් සතා මරා නොදමනු ඇත. සතුරාද නොවළක්වනු ඇත. නමුත් සැබැවින්ම එය ඇස් අන්ධ කරන අතර දත්ද කඩා දමනු ඇත.“ යැයි පැවසූහ.

අබ්දුල්ලාහ් ඉබ්නු මුගෆ්ෆල් -රළියල්ලාහු අන්හුමා- තුමා විසින් වාර්තා කරන ලදී. “ඇගිලි අතර ගල්කැට තබා විඳීමෙන් අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වළක්වා “සැබැවින්ම එය දඬයම් සතුන් මරා නොදමන අතර සතුරාද නොවළක්වනු ඇත. නමුත් සැබැවින්ම එය ඇස් අන්ධ කරන අතර දත්ද කඩා දමනු ඇත.“ යැයි පැවසූහ. තවත් වාර්තාවක: ඉබ්නු මුගෆ්ෆල් තුමාට සමිපතයකු ඇගිලි අතර ගල් කැට දමා විද්දේය. එවිට එතුමා ඔහුව වළක්වා: “සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් ඇගිලි අතර ගල් කැට දමා විඳීමෙන් වළක්වා ඇතැයි පවසා සිටියේය. ඔහු “සැබැවින්ම එය දඬයම් සත්වයා මරා නොදමනු ඇතැයි පවසා නැවතත් සිදු කළේය. එවිට එතුමා: සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් - සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා එයින් වළක්වා ඇති බව මම ඔබට පැවසුවෙමි. ඉන්පසුවත්
ඔබ එසේ ඇගිලි අතර ගල් කැට තබා විඳින්නෙහිය. මම කිසිවිටෙක ඔබ සමග කතා නොකරමි යැයි පැවසූහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ඇගිලි අතර ගල් කැට දමා විඳීමෙන් වැළැක්වූ බව අබ්දුල්ලාහ් ඉබ්නු මුගෆ්ෆල් -රළියල්ලාහු අන්හුමා- තුමා විසින් දන්වා සිටියේය. “සැබැවින්ම එය දඬයම් සත්වයා මරා නොදමනු ඇත“ යැයි එතුමා පැවසූහ. තවත් වාර්තාවක දඬයම් සත්වයා දඬයම් නොකරනු ඇතැයි ද සඳහන්ව ඇත. එමෙන්ම සතුරාව නොවළක්වනු ඇත. එය ඇස් අන්ධ කරන අතර දත් කඩා දමනු ඇතැයි සඳහන් වී ඇත. අල් හද්ෆ් යන පදයට විද්වතුන් පවසා සිටිනුයේ, මිනිසා ගල් කැටයක් දකුණු දබරැගිල්ල හා වම් දබරැගිල්ල අතර තබා එසේ නැතිනම් දබරැගිල්ල හා පහපට ඇඟිල්ල අතර තබා මහපට ඇගිල්ල මත ගල් කැටයක් තබා එය දබරැගිල්ලෙන් වළක්වාලීම හෝ දබරැගිල්ල මත තබා මහපොට ඇගිල්ලෙන් එය වළක්වාලීමයි. යන්නයි. නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා එයින් වැළැක්වූහ. එයට හේතුව එය සිදු කළ විට, සැබැවින්ම එය ඇස් අන්ධ කරන අතර දත් කඩා දමනු ඇතැයි පවසා සිටියහ. එය දඬයම් සත්වයා දඬයම් නොකරයි යනුවෙන් පවසා ඇත්තේ එ් සඳහා ප්රමාණවත් බලයක් එයට නොමැති බැවිනි. එමෙන්ම සතුරා නොවළක්වනු ඇත යනුවෙන් පවසා ඇත්තේ සතුරාට හී පහරින් බලපෑමක් ඇති වුවද කුඩා ගල් කැට විඳීමෙන් අනතුරක් සිදු නොවන බැවිනි පසුව ඔහුට සමීප අයෙකු පිටතට පැමිණ එසේ ගල් කැට විද්දේය. එවිට එසේ ගල්කැට විඳීමෙන් එතුමා ඔහුව වළක්වා සැබැවින්ම නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා එයින් වළක්වා ඇති බව දන්වා සිටියේය. පසුව දෙවන වරටත් ඔහු එසේ විඳිනු දුටු එතුමා නබි සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා එසේ ගල්කැට විඳීමෙන් වළක්වා ඇති බව මම ඔබට පවසා සිටියද ඔබ නැවත එසේ ගල් කැට විඳින්නෙහිය මම ඔබ සමඟ කිසිවිටෙක කතා නොකරමි යැයි ඔහුට පැවසූහ. පසුව ඔහුගෙන් ඉවත්ව සිටියහ. හේතුව නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලලම්- තුමා වැළැක්වූ දෙයකට විරුද්ධව ඔහු කටයුතු කළ බැවිනි.